චක්‍රලේඛ අංක - LAE/2025-01

මගේ අංකය :- TR/01/13/2025/VR
මැතිවරණ කොමිෂන් සභාව,
සරණ මාවත, රාජගිරිය.
2025.03.04

TR - 01

ඉතා වැදගත් / හදිසියි

සියලුම අමාත්‍යාංශ ලේකම්වරු /පළාත් ප්‍රධාන ලේකම්වරු,
සියලුම පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්/ පළාත් සභා අමාත්‍යාංශ ලේකම්වරුන්,
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
සියලුම රාජ්‍ය සංස්ථා/ රාජ්‍ය සමාගම් සහ හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල සභාපතිවරුන්/ සාමාන්‍යාධිකාරීවරුන් වෙත,

**<u>දීප ව්‍යාප්ත ඡන්ද විමසීමක දී රාජකාරී වල යෙදවීම පිණිස රජයේ වාහනවල තොරතුරු ලබා ගැනීම.</u>**

දීපව්‍යාප්ත ඡන්ද විමසීමක දී ඡන්ද පොළ රාජකාරී සඳහා නිලධාරීන් ප්‍රවාහනය, ඡන්ද පොළ සඳහා අවශ්‍ය අනෙකුත් උපකරණ, ලිපිද්‍රව්‍ය ආදිය ප්‍රවාහනය කිරීම සඳහා ද දිස්ත්‍රික් තේරීම් භාර නිලධාරීන්ට කාර්, ජීප්, ස්ටේෂන් වැගන්,වෑන්, ඩබල් කැබ්, කෲ කැබ්, බස් රථ සහ ත්‍රීරෝද රථ ආදී වශයෙන් මෝටර් රථ වාහන විශාල සංඛ්‍යාවක් අවශ්‍ය වනු ඇත. එබැවින් ඔබ ආයතනයේ ඇති මනා ධාවන තත්වයෙන් යුත් සෑම මෝටර් වාහනයක්ම ඉදිරි ඡන්ද විමසීමකදී ඡන්ද විමසීම් රාජකාරි සඳහා යොදා ගැනීම පිණිස අදාළ දිස්ත්‍රික්කයේ තේරීම්භාර නිලධාරී වෙත ලබාදෙන ලෙස සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්ගෙන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගෙන්, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලයන්හි සභාපතිවරුන්ගෙන් ඉල්ලා සිටීම් වස් මෙම ලිපිය නිකුත් කරනු ලැබේ. මෙම ලිපිය සහ වාහන සංගණන ආකෘති පත්‍රය මැතිවරණ කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවියෙන් ද (www.elections.gov.lk) බාගත කර ගත හැකිය.

02. ඔබේ අමාත්‍යාංශය, දෙපාර්තමේන්තුව, ව්‍යවස්ථාපිත ආයතනය සතුව ඇති මනා ධාවන තත්වයකින් යුත් සියළුම වාහන පිළිබඳ විස්තර (මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ ලබාගත් වාහනද ඇතුළුව) මෙයට යාකර ඇති වාහන සංගණන ආකෘති පත්‍රයට ඇතුළත් කර මෙම චක්‍රලේඛය ලැබී සති 2ක් ඇතුළත ***කොළඹ දිස්ත්‍රික්කය තුළ පිහිටි කොළඹ,දෙහිවල-ගල්කිස්ස සහ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහනගර සභා ප්‍රදේශය සහ සෙත්සිරිපාය I හා II, ඉසුරුපාය හා සුහුරුපාය යන කාර්යාල සංකීර්ණයන්හි පිහිටි කාර්යාල වල වාහන පිළිබඳ ලැයිස්තු මැතිවරණ කොමසාරිස් ජනරාල්, මැතිවරණ කොමිෂන් සභාව, රාජගිරිය යන ලිපිනයටද***, **කොළඹ දිස්ත්‍රික්කයේ පූර්වයෙන් සඳහන් නොවූ ප්‍රදේශ තුළ පිහිටි සෙසු රජයේ කාර්යාලයන්හි වාහන, නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස් , කොළඹ නාගරික මැතිවරණ කාර්යාලය, 5 වන මහල " නිල මැදුර ", ඇල්විටිගල මාවත, නාරාහේන්පිට, කොළඹ 05** වෙත ද, අනෙකුත් දිස්ත්‍රික්වල පිහිටි රජයේ කාර්යාලවල තොරතුරු අදාළ දිස්ත්‍රික්කයේ මැතිවරණ කාර්යාලය වෙත එවීමටද නොපමාව ක්‍රියාකළ යුතුය.

03. දීප ව්‍යාප්ත ඡන්ද විමසීමක දී සෑම දිස්ත්‍රික්කයකම තේරීම්භාර නිලධාරීන්ට වාහන විශාල සංඛ්‍යාවක් අවශ්‍ය වන අතර එම වාහන තම දිස්ත්‍රික්කයේ ඇති අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, සංස්ථා මණ්ඩලවලින් ලබාගත යුතුවේ. එබැවින් අමාත්‍යාංශ ලේකම්වරුන්, ප්‍රධාන ලේකම්වරුන්,

දෙපාර්තමේන්තු ප්‍රධානීන්, පළාත් සභා අමාත්‍යාංශ ලේකම්වරුන්, සංස්ථා, මණ්ඩල, ව්‍යවස්ථාපිත ආයතනයන්හි සභාපතිවරුන්/ ප්‍රධාන විධායක නිලධාරීන් සහ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව නිල මට්ටමින් වාහන හිමිකම් ඇති නිලධාරීන්ට එක් වාහනයක් බැගින් වන පරිදි වෙන්කර ඇති වාහන හැර අනෙකුත් සියළුම වාහන ඡන්ද විමසීමේ කටයුතු සඳහා ලබාදිය යුතු වාහන සේ සළකා කටයුතු කළයුතු බවට අදාළ ප්‍රධානීන් දැනුවත් කිරීමට කරුණාකර කටයුතු කරන්න. මෙම චක්‍රලේඛය සමග අමුණා ඇති මුද්‍රිත සංගණන ආකෘතියෙහි 8 වන තීරුවෙහි ඒ ඒ වාහන ස්වභාවය අනුව සංචිත වාහනයක් නම් අදාළ තීරුවේ (√) ලකුණ ද වෙන්කළ වාහනයක් නම් ඊට අදාළ තීරුවෙහි (√) ලකුණ ද සමග වාහනය වෙන්කර ඇති නිලධරයාගේ විස්තර ද සටහන් කරන්න. මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ ලබාගත් වාහනයක් නම් එයට ඉදිරියෙන් (OL) යනුවෙන් සටහන් කරන්න. <u>තවද වාහන හිමිකම් නොමැති මාණ්ඩලික නිලධාරීන් ඇතුළුව නිලධාරී කණ්ඩායම් ප්‍රවාහනයට යොදා ඇති සියළු වාහන පිළිබඳ තොරතුරු ද ඒ ඒ ආයතනයන්හි එක් එක් ශාඛාවන්හි රාජකාරීන් සඳහා වෙන්කර ඇති වාහන ද ඇතුළුව මෙම සියළු වාහන සංචිත වාහනසේ සළකා ඡන්ද විමසීමේ රාජකාරී සඳහා ලබාදිය යුතු බවට අදාළ ආයතන ප්‍රධානීන් දැනුම්වත් කළ යුතුය.</u>

04. ඡන්ද විමසීම් නිමවීමෙන් පසු සියළුම දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් විසින් මා වෙත එවනු ලබන වාර්තාවන්හි සඳහන් වන ප්‍රධාන කරුණක් වනුයේ, ඡන්ද විමසීමේ රාජකාරී සඳහා යොදා ගැනීම පිණිස කොළඹ සංචිතයෙන් වෙන්කර දෙනු ලබන වාහනවලින් වැඩි ප්‍රමාණයක් ද දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී වෙත නියමිත පරිදි වාර්තා නොකරන බවයි. මේ තත්ත්වය නිසා තමන් දැඩි අපහසුතාවට පත්වන බවද එම වාර්තාවන්හි දිගින් දිගටම සඳහන්වේ. මෙය කිසිසේත් සුලුකොට තැකිය හැකි කාර්යයක් නොවන බව අවධාරණය කරන අතර <u>**ඡන්ද විමසීමක දී ඡන්ද විමසීමේ රාජකාරී සඳහා නිලධාරීන් මෙන්ම වාහන සහ අනෙකුත් රාජ්‍ය සම්පත් යොදා ගැනීමේ පූර්ණ බලතල මැතිවරණ කොමිෂන් සභාව සතු බවද අවධාරණය කරනු කැමැත්තෙමි.**</u> ඡන්ද විමසීමේ කටයුතු සඳහා රාජ්‍ය ආයතන සතු වාහන නියමිත පරිදි ලබාදීම එම ආයතන ප්‍රධානීන් සතු වගකීමක් බවද මටද පිටපතක් සහිතව ඡන්ද විමසීම් කිපයකදීම ජනාධිපති ලේකම්වරයා විසින් අමාත්‍යාංශ ලේකම්වරු පළාත් ප්‍රධාන ලේකම්වරු හා දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල සභාපතිවරුන් වෙත උපදෙස් ලබාදී ඇති බවද සිහිපත් කරනු කැමැත්තෙමි. එබැවින් ඉදිරි ඡන්ද විමසීම්වල දී මෙවැනි තත්ත්වයක් ඇති නොවන සේ කටයුතු කිරීමට ඔබගේ නිලධාරීන් දැනුම්වත් කරන්නේ නම් බෙහෙවින් කෘතඥ වෙමි.

05. ඉදිරි ඡන්ද විමසීම්වල දී ඡන්ද විමසීමේ රාජකාරී සඳහා තෝරාගනු ලබන නිලධාරීන් අතර <u>**නිල වාහන ලබා දී ඇති නිලධාරීන්ට පමණක් එම නිල වාහනය ඡන්ද විමසීමේ රාජකාරී සඳහා යොදා ගැනීමට අදාළ දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී විසින් අනුමැතිය ලබාදෙනු ඇත. අනෙකුත් කිසිදු නිලධාරියෙකු ඡන්ද විමසීමේ රාජකාරී සඳහා යාම පිණිස තම කාර්යාලයේ සංචිත වාහනයක් යොදා නොගත යුතුය.**</u>

06. <u>**වාහන පිළිබඳ ලැයිස්තු යැවීමේ වගකීම අමාත්‍යාංශයක් සම්බන්ධයෙන් නම් ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරයෙකුගේ ද දෙපාර්තමේන්තුවක් සම්බන්ධයෙන් නම් අතිරේක හෝ නියෝජ්‍ය ප්‍රධානියෙකුගේ ද ව්‍යවස්ථාපිත මණ්ඩලයක් හෝ සංස්ථාවක් සම්බන්ධයෙන් නම් අතිරේක සාමාන්‍යාධිකාරීවරයෙකුගේ තත්ත්වයට නොඅඩු නිලයක් දරණ නිලධාරියෙකු වෙත පැවරිය යුතුය.**</u> ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104(ආ)4අ ව්‍යවස්ථාවට අනුව රාජ්‍ය දේපළ වන මෙකී වාහන අනිසි ලෙස භාවිත කිරීමක් සිදු නොවන ලෙසට වගබලා

ගැනීම සඳහා ආයතනය සතු සියළුම වාහන පිළිබඳ විස්තර ලබාදීමට සෑම ආයතන ප්‍රධානියෙකුම අනිවාර්යයෙන්ම කටයුතු කළ යුතුය. සාමාන්‍යයෙන් ඡන්ද විමසීම පැවැත්වෙන දිනට කලින් සම්පූර්ණ දින තුනක කාල සීමාවක් සඳහා මෙම මෝටර් රථ වාහන අවශ්‍ය වන අතර ඡන්ද විමසීම් දිනයට පසු දිනයේ ඒවා ආපසු මුදා හරිනු ඇත.

07. **බොහෝ සේ අබලන්වීම නිසා හෝ බරපතල හදිසි අනතුරුවලට භාජනය වීම නිසා හෝ මුළුමනින්ම අළුත්වැඩියා කළයුතු වාහන හැර අනෙකුත් සියළුම වාහන විස්තර මේ සමග ඇති ආකෘතියට ඇතුළත් කළ යුතුය.** තවද ඔබ විස්තර ඉදිරිපත් කළ වාහන පරීක්ෂාකර බලා අවශ්‍ය වන්නේ නම් ඒවායෙහි කළයුතු සුළු අලුත්වැඩියාවන් හෝ සේවා කිරීම් ඇත්තේ නම් ඒවා සිදු කොට ඡන්ද විමසීමේ රාජකාරී කටයුතුවල යෙදවීම පිණිස ඡන්ද විමසීමේ දිනයට යටත් පිරිසෙයින් සතියකට වත් පෙර සූදානම් කර තැබිය යුතුය.

08. වාහන සංගණනයේ දී කොළඹ දිස්ත්‍රික්කයේ රජයේ ආයතනයන්හි තොරතුරු ලබාදුන් වාහන ඡන්ද විමසීමේ රාජකාරී සඳහා යොදා ගැනීම පිණිස එක් එක් දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන්ගේ ඉල්ලීම පදනම් කරගෙන වෙන්කර දෙනු ලැබේ. එසේ තේරීම්භාර නිලධාරී / දිස්ත්‍රික් ලේකම් වෙත වෙන්කර දෙන ලද වාහන ඡන්ද විමසීමේ රාජකාරී සඳහා යොදා ගැනීම පිණිස තේරීම්භාර නිලධාරී විසින් එම වාහන වාර්තා කළයුතු දිනය ස්ථානය හා වේලාව දැනුම් දුන් පසු නියමිත දින / වේලාවට වාර්තා කළ හැකිවන පරිදි එම වාහන සියල්ල නිදහස් කර යැවීමට කටයුතු කළ යුතුය. තම ආයතනයේ නිලධාරීන්ද අදාළ දිස්ත්‍රික්කවල මැතිවරණ රාජකාරී සඳහා යාමට නියමිතව තිබුණ ද ඔවුන් සමග යැවීමට දිස්ත්‍රික්ක වෙත වෙන්කල වාහන කිසිසේත්ම රඳවා නොගත යුතුය. ඒ පිළිබඳව ඔබ ආයතනයේ වාහන භාරව කටයුතු කරන නිලධාරියා කරුණාකර දැනුවත් කරන්න.

09. ඡන්ද විමසීමේ රාජකාරී සඳහා දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් වෙත වෙන්කර දෙනු ලබන වාහන සඳහා අවශ්‍ය ඉන්ධන ලිහිසි තෙල් ආදිය තේරීම්භාර නිලධාරීන් විසින් ඉන්ධන ඇණවුම් මගින් සැපයීමට කටයුතු සලස්වනවා ඇත. වාහන අයත් ආයතනය විසින් වාහනය වෙන්කර දෙන ලද දිස්ත්‍රික්කයේ තේරීම්භාර නිලධාරීගේ කාර්යාලයට වාර්තා කිරීමට යාමට ප්‍රමාණවත් ඉන්ධන පමණක් ලබාදිය යුතුය. ***කොළඹ දිස්ත්‍රික්කයේ පිහිටි රජයේ කාර්යාල වල වාහන වෙනත් දිස්ත්‍රික්ක වල ඡන්ද විමසීමේ රාජකාරී සඳහා වාර්තා කර ඇති විට එම වාහන වලට අදාල දිස්ත්‍රික්කයට යාමට ඉන්ධන වලට වැයවූ මුදල ප්‍රතිපූර්ණය කිරීම සඳහා මැතිවරණ කොමිෂන් සභාව, සරණ මාවත, රාජගිරිය යන ලිපිනය වෙත එවිය යුතු අතර අනෙකුත් දිස්ත්‍රික්ක වලින් රාජකාරී සඳහා වාර්තා කළ වාහනවල ඉන්ධන ප්‍රතිපූර්ණය සඳහා වාහනය අයත් කාර්යාලය පිහිටි දිස්ත්‍රික්කයේ මැතිවරණ කාර්යාලය වෙත ඉල්ලීම් ඉදිරිපත් කළ යුතුය.***

10. රියදුරන්ගේ අතිකාල හා සංයුක්ත දීමනා ගෙවීම ඡන්ද විමසීම් රාජකාරීවල නිරත කරවන කාර්ය මණ්ඩලයට ගෙවීම් කිරීම පිළිබඳ උපදෙස් ඡන්ද විමසීම නිමවීමෙන් පසු නිකුත් කරනු ලබන චක්‍රලේඛය මගින් දන්වනු ඇත.

11. තේරීම්භාර නිලධාරී විසින් තමන් වෙත වාර්තා කරන ලෙස දැනුම් දෙනු ලබන සියළුම වාහන අදාල තේරීම්භාර නිලධාරී වෙත යැවීමේ පූර්ණ වගකීම වාහන සංගණන තොරතුරු පත්‍රිකාව සහතික කර ඇති නිලධාරියා විසින් භාරගත යුතුය.

12. ඡන්ද විමසීම් රාජකාරී සඳහා යොදනු ලබන සියළුම රියදුරන්ට හා රිය ශෝධකයන්ට තැපැලෙන් ඡන්දය දීමේ පහසුකම් සලසා ගැනීමට හිමිකම් තිබේ.

13. ඒ ඒ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා වලින් සංශෝධිත ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104 (උ) ව්‍යවස්ථාවෙන් මැතිවරණ කොමිෂන් සභාව වෙත පැවරී ඇති බලතල පරිදි මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

14. ඉදිරි ඡන්ද විමසීම් කටයුතු සාර්ථක කර ගැනීම සඳහා ඔබ ඇතුළු කාර්ය මණ්ඩලයේ සියළු දෙනාගෙන් ලැබෙන සහාය බෙහෙවින් අගය කොට සලකමි.

**සමන් ශ්‍රී රත්නායක,**
මැතිවරණ කොමසාරිස් ජනරාල්,

**පිටපත් :**

| | |
|---|---|
| 1. ලේකම් - මැතිවරණ කොමිෂන් සභාව<br>2. සියළුම දිස්ත්‍රික් ලේකම් / දිසාපතිවරුන් දිස්ත්‍රික් නියෝජ්‍ය / සහකාර මැතිවරණ කොමසාරිස්වරුන්<br>3. ප්‍රධාන කාර්යාලයේ සියළුම මාණ්ඩලික නිලධාරීන්<br>4. අතිරේක මැතිවරණ කොමසාරිස් (පළාත් පාලන) | දැන ගැනීම පිණිස සහ අවශ්‍ය කටයුතු සඳහා කාරුණිකව. |

